සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாண கல்வித் திணைக்களம்
Western Provincial Education Department

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாண கல்வித் திணைக்களம்
Western Provincial Education Department

දෙවන වාර ඇගයීම - 2018
இரண்டாம் தவணை மதிப்பீடு - 2018
Second Term Evaluation - 2018

11 ශ්‍රේණිය
தரம் 11
Grade 11

# ගණිතය I පත්‍රය
# கணித வினாதாள் - 1
# Mathematics Paper - I

පැය දෙකයි
இரண்டு மணி நேரம்
*Two Hours*

නම / විභාග අංකය : ..........................................................................................

..............................................................
නිවැරදි බවට නිරීක්ෂකගේ අත්සන

වැදගත් :

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 8 කින් සමන්විතය.
- මෙම පිටුවේත් තුන්වැනි පිටුවේත් නියමිත ස්ථානවල ඔබේ විභාග අංකය නිවැරදිව ලියන්න.
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
- පිළිතුරු සැපයීමේ දී අදාළ පියවර සහ නිවැරදි ඒකක දැක්වීම අවශ්‍යය.
- A කොටසෙහි අංක 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 02 බැගින් හිමි වේ. B කොටසෙහි එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් ද ලැබේ.

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා

| ප්‍රශ්න අංකය | | ලකුණු |
|---|---|---|
| A | 1 - 25 | |
| B | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| මුළු ලකුණු | | |

www.mathsland.org

............................
ලකුණු කළේ

## A කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.

1) වාර්ෂික වටිනාකම රු. 60 000 ක් ලෙස තක්සේරු කර ඇති නිවසක් සඳහා වාර්ෂික වරිපනම් බදු මුදල රු. 2400ක් වේ නම් කාර්තුවකට ගෙවිය යුතු මුදල කීය ද?


2) පෘෂ්ඨ වර්ගඵලය $1188cm^2$ ක් වූ සිලින්ඩරයක වක්‍ර පෘෂ්ඨ වර්ගඵලය $880cm^2$ වේ. එහි පතුලේ වර්ගඵලය වන්නේ

$(i)\ 308cm^2$ $(ii)\ 154cm^2$ $(iii)\ 616cm^2$

3) 3 , 6 , 12 , .. ගුණෝත්තර ශ්‍රේඩියේ 8 වන පදය සොයන්න. ($2^7 = 128$ වේ.)

4) සාධක සොයන්න. $x^2 - 4x - 21$

5) $ABC$ ත්‍රිකෝණයේ $AB = AC$ වේ. $x$ හි අගය සොයන්න.




6) කිසියම් කාර්යයකින් හරි අඩක් නිම කිරීමට මිනිසුන් 5 දෙනෙකුට දින 4 ක් ගත වේ. එම සම්පූර්ණ කාර්යය සඳහා මිනිස් දින කීය ද?

www.mathsland.org


7) සුළු කරන්න. $\dfrac{y}{3} \div \dfrac{4y}{x}$

8) $ABO$ හා $COD$ ත්‍රිකෝණ කෝ.කෝ.පා. අවස්ථාව යටතේ අංගසම වේ. අංගසම බව දැක්වීම සඳහා ලිවිය යුතු ඉතිරි පියවර ලියන්න.


$AB = CD$ (දී ඇත.)

$A\hat{B}O = O\hat{C}D$ (දී ඇත.)

……..= ……. (…………..)



9) දළ මිනුම් සහිතව ඇඳ ඇති ප්‍රිස්මයේ ත්‍රිකෝණාකාර මුහුණත හැර එකිනෙකට වෙනස් මුහුණත් දෙකක දළ සටහන් අඳින්න.





10) S = { $x$; $x$ යනු 7 හි ගුණාකාරයකි. $0 < x < 30$ }මෙය වෙනත් කුලක අංකන ක්‍රමයකින් දක්වන්න.

11) $x^2, 2xy , 3y$ යන වීජීය ප්‍රකාශන තුනෙහි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.


www.mathsland.org

12) රූපයේ $PR//ST$ වේ. $P\hat{Q}R$ හා $Q\hat{P}R$ කෝණ පිළිවෙලින් $50°$ සහ $70°$ නම් $x$ හි අගය සොයන්න.





13) $3x - 1 \geq 5$ අසමානතාවය සපුරාලන කුඩා ම ධන නිඛිලය කුමක් ද ?


14) $O$ කේන්ද්‍රය වූ වෘත්තයේ $AB$ හා $AC$ යනු ජ්‍යායන් දෙකකි. $AB$ හා $AC$ ජ්‍යායවල මධ්‍ය ලක්ෂ්‍යන් පිළිවෙලින් $X$ හා $Y$ වේ. $X\hat{O}Y = 120°$ නම් $B\hat{A}C$ හි අගය සොයන්න.




15) $PQR$ ත්‍රිකෝණයේ පරිමිතිය $28cm$ ක් නම් $ST$ පාදයේ දිග සොයන්න.




16) 11 ශ්‍රේණියේ සිසුන් සමූහයක් චිත්‍ර , නැටුම් , සංගීතය හා නාට්‍ය හදාරන ආකාරය මෙම වට ප්‍රස්තාරයෙන් දැක්වේ. නැටුම් හදාරන සිසුන් 45 ක් සිටී නම් නාට්‍ය හදාරන සිසුන් ගණන කීය ද?





17) රූපයේ දී ඇත්තේ $O$ කේන්ද්‍රය වූ වෘත්තයකි. $ABCD$ ලක්ෂ්‍ය වෘත්තය මත පිහිටා ඇත. ඒ ඇසුරෙන් පහත ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් ✗ ලකුණ ද ඉදිරියේ දී ඇති කොටුව තුළ යොදන්න.





| | |
|---|---|
| $A\hat{O}D = 2\,A\hat{B}D$ | |
| $A\hat{B}D = A\hat{C}D$ | |

18) රූපයේ දී ඇති දත්ත අනුව $A$ සිට $B$ පෙනෙන ආකාරය අවරෝහණ කෝණ ඇසුරෙන් විස්තර කරන්න.




www.mathsland.org


19) ඛණ්ඩාංක තලයේ නිරූපණය වන $AB$ සරල රේඛාවේ අනුක්‍රමණය සොයන්න.



20) $ABCD$ හා $CDPQ$ යනු සමාන්තරාස්‍ර දෙකකි. දී ඇති තොරතුරු ඇසුරෙන්


$(i)$ $PQ$ දිගත්

$(ii)$ $\hat{a}$ හි අගයත් සොයන්න.




21) $64 = 2^6$ යන්න ලඝු අකාරයෙන් දක්වන්න.

22) තිළිණ නිවසේ සිට පාසලට ගමන් කර ඇති ආකාරය මෙම ප්‍රස්තාරයෙන් දැක්වේ. ඔහුගේ වේගය මිනිත්තුවට මීටර කීයක් වේ ද ?





www.mathsland.org

23) $(x-2)(x+1)=0$ සමීකරණය විසඳන්න.

24) අංක 1 සිට 6 තෙක් අංක ලියන ලද සර්වසම දාදු කැටයක් උඩ දැමූ විට 4 ට වැඩි අගයක් ලැබීමේ සම්භාවිතාවය සොයන්න.

25) රූපයේ දැක්වෙන $AB$ සහ $AC$ යනු ඉඩමක මායිම් දෙකකි. එම මායිම් දෙකට සම දුරින් ද $A$ හා $C$ ට සම දුරින් ද දුරකථන කණුවක් සිටුවිය යුතුව ඇත. පථ පිලිබඳ දැනුම භාවිතයෙන් ඊට සුදුසු ස්ථානය $(x)$ ලකුණු කරන්න.



## B කොටස

ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

1. නිවසක සම්පූර්ණයෙන් පිරි ඇති ජල ටැංකියකින් උදය කාලය තුළ $\frac{1}{8}$ ක් ප්‍රයෝජනයට ගන්නා ලදී.

$(i)$ ප්‍රයෝජනයට ගත් පසු ටැංකියේ ඉතිරි වන ජල ප්‍රමාණය භාගයක් සේ දක්වන්න.

$(ii)$ ටැංකියේ ඉතිරි වූ ජල ප්‍රමාණයෙන් $\frac{5}{7}$ ක් සවස් කාලයේ ප්‍රයෝජනයට ගෙන තිබුණි නම් සවස් කාලය තුළ ප්‍රයෝජනයට ගත් ජල ප්‍රමාණය කිනම් භාගයක් ද ?

$(iii)$ ඊට පසු ටැංකියේ ඉතිරි වී ඇති ජල ප්‍රමාණය ලීටර 250 ක් නම් ටැංකියේ ධාරිතාව සොයන්න.

$(iv)$ මෙම ටැංකියට ජලය සැපයෙන්නේ මිනිත්තුවට ලීටර 50 ක ඒකාකාර සීඝ්‍රතාවයකින් නම් ටැංකිය සම්පූර්ණයෙන් පිරවීමට ගතවන කාලය මිනිත්තු කියක් වේ ද ?

$(v)$ ටැංකිය ඝණක හැඩති නම් සහ පතුලේ වර්ගඵලය $1m^2$ නම් ටැංකියේ උස සොයන්න.

2. $(a)$ ඉඳුවර තමා සතු කොටස් 500 ක් ලාභාංශ ලැබීමෙන් පසු රු.40 000 කට විකිණීමෙන් රු.4000 ක ප්‍රාග්ධන ලාභයක් ලැබීය.

www.mathsland.org

$(i)$ ඔහු විකුණු කොටසක වෙළඳ පොළ මිල කීය ද ?


$(ii)$ ඔහු එම කොටස් මිලදී ගැනීමට ආයෝජනය කළ මුදල කීය ද ?

$(iii)$ ඔහු එම කොටසක් මිලදී ගත්තේ කොටසක වෙළඳ පොළ මිල කීය බැගින් ද ?

$(iv)$ සමාගමේ කොටසකට රු.6 ක ලාභාංශයක් ගෙවයි නම් ඉඳුවර ලැබූ ලාභාංශය කීය ද ?

$(b)$ 10% ක වාර්ෂික වැල් පොලී අනුපාතිකයක් යටතේ රු.40 000 ක් මූල්‍ය ආයතනයක තැන්පත් කළ ජෙසිමාට වසර දෙකකට පසු ලැබෙන මුළු මුදල සොයන්න.

3. සැරසිල්ලක කොටසක් රූපයේ දැක්වේ.මෙය $DBC$ සෘජුකෝණි ත්‍රිකෝණාකාර කොටසකින් ද කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය $90^{\circ}$ ක් සහ අරය $7cm$ ක් වූ කේන්ද්‍රික ඛණ්ඩයකින් ද සමන්විත වේ. (පහත ගණනය කිරීම් සඳහා $\pi = \frac{22}{7}$ යොදාගන්න.)




$(i)$ $ABD$ කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය සොයන්න.

$(ii)$ $BCD$ කොටසේ වර්ගඵලය $ABD$ කොටසේ වර්ගඵලයට සමාන වේ නම් $BC$ දිග සොයන්න.

$(iii)$ $AD$ චාප දිග සොයන්න.

$(iv)$ $DC$ දිග ආසන්න සෙන්ටිමීටරයට 13 ක් වේ නම් මෙම සැරසිල්ලේ පරිමිතිය ආසන්න සෙන්ටිමීටරයට සොයන්න.


$(v)$ $ABD$ කොටස වෙනුවට එම වර්ගඵලයට සමාන වර්ගඵලයකින් යුත් සෘජුකෝණාස්‍රාකාර කොටසක් $DB$ මායිමක් වන සේ එම පැත්තටම වෙන් කර ගැනීමට අදහස් කරයි නම් එහි දළ රූපයක් ඉහත රූපයේම මිනුම් සහිතව දක්වන්න.

4. $(a)$ ගමක සිටින 100 දෙනෙක් අතුරෙන් 53 දෙනෙකු රජයේ රැකියා කරති.

www.mathsland.org

$(i)$ රජයේ රැකියා නො කරන අය කී දෙනෙකු මෙහි සිටිත් ද?

$(ii)$ මේ සියලු දෙනා අතුරෙන් 49දෙනෙක් ගැහැණු අය වෙත් නම් එම තොරතුරු ඇතුලත් කරමින් පහත වෙන් රූපය සම්පූර්ණ කරන්න.





$(iii)$ මේ මුළු පිරිස අතරින් රජයේ රැකියා කරන පිරිමි අය කී දෙනා ද ?

$(b)$ පෙට්ටියක අංක 1 සිට 4 දක්වා ලියූ සර්වසම කාඩ් පත් 4 ක් ඇත. අහඹු ලෙස පෙට්ටියෙන් අංකයක් ලියූ කාඩ් පතක් ඉවතට ගෙන එහි අංකය සටහන් කරගත් පසු එය පෙට්ටියට දමා තවත් කාඩ් පතක් ඉවතට ගෙන අංකය සටහන් කරනු ලැබේ.

$(i)$ අදාළ නියැදි අවකාශය කොටු දැල මත දක්වන්න.

$(ii)$ අවස්ථා දෙකේදීම ඉවතට ගත් කාඩ් පත්වල අංක දෙකේ එකතුව 5 වීමේ සම්භාවිතාව සොයන්න.





5. ගණිතය ප්‍රශ්න පත්‍රයක් සඳහා සිසුන් පිරිසක් ලබාගත් ලකුණු හා සිසුන් ගණන දැක්වෙන තොරතුරු වගුවක් පහත දැක්වේ. (මෙහි 20 − 30 යනු 20 හෝ ඊට වැඩි එහෙත් 30ට අඩු යන්නයි.)

www.mathsland.org

| ලකුණු | 20 – 30 | 30 – 40 | 40 – 50 | 50 – 60 | 60 – 70 | 70 – 100 |
|---|---|---|---|---|---|---|
| සිසුන් ගණන | 3 | 4 | 10 | 7 | 6 | 6 |

$(i)$ 70 – 100 පන්ති ප්‍රාන්තරයේ ඇති සිසුන් සංඛ්‍යාව ජාල රේඛයේ දැක්වීමට එම ස්ථම්භයේ උස කීයක් ගත යුතු ද ?

$(ii)$ පහත කොටු දැල මත ඉහත තොරතුරු ජාල රේඛයකින් දක්වන්න.



$(iii)$ ඉහත ජාල රේඛයට අදාළ සංඛ්‍යාත බහුඅස්‍රය අඳින්න.

$(iv)$ ලකුණු 60 ට වැඩියෙන් ලබාගත් සිසුන් ගණන මුළු සිසුන් ගණනේ භාගයක් ලෙස දක්වන්න.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாண கல்வி திணைக்களம்
Western Provincial Education Department

දෙවන වාර ඇගයීම - 2018
இரண்டாம் தவணை மதிப்பீடு - 2018
Second Term Evaluation - 2018

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | ගණිතය II පත්‍රය<br>கணித வினாதாள் - II<br>Mathematics Paper - II | පැය තුනයි<br>மூன்று மணி நேரம்<br>Three Hours |
|---|---|---|

**වැදගත් :**

- **A කොටසෙන් ප්‍රශ්න 5ක් හා B කොටසෙන් ප්‍රශ්න 5ක් තෝරා ගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී අදාළ පියවර හා නිවැරදි ඒකක ලියන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමිවේ.**
- **පතුලේ අරය r ද, උස h ද, සෘජු වෘත්ත කේතුවක පරිමාව $\frac{1}{3}\pi r^2 h$ වේ.**
- **අරය r සහ උස $h$ වන සිලින්ඩරයක පරිමාව $\pi r^2 h$ වේ.**

A කොටස

ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

1. අත්පිට මුදලට රු. 30 000 ක් වටිනා ජංගම දුරකතනයක් හීනවන ශේෂ ක්‍රමයට පළමුව රු. 12 000ක් ගෙවා ඉතිරි මුදල 36% ක වාර්ෂික පොලි අනුපාතිකයක් යටතේ සමාන මාසික වාරික 15 කින් ගෙවා නිම කිරීමට ලබාගත හැකිය.එවිට ගෙවීමට සිදුවන වාරිකයක වටිනාකම සොයන්න.

2. y = $1 + 2x - x^2$ ශ්‍රිතයේ ප්‍රස්තාරය දීම සඳහා සකස් කරන ලද අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

| $x$ | $-2$ | $-1$ | 0 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|
| $y$ | $-7$ | $-2$ | 1 | .... | 1 | $-2$ | $-7$ |

www.mathsland.org

$(a)$ $(i)$ $x = 1$ විට $y$ හි අගය සොයන්න.

$(ii)$ සුදුසු පරිමාණයක් යොදා ගනිමින් ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

$(b)$ ප්‍රස්තාරය ඇසුරෙන් ;

$(i)$ සමමිතික රේඛාවේ සමීකරණය ලියන්න.


$(ii)$ y = $-(x-a)^2 + b$ ආකාරයෙන් ප්‍රස්තාරයේ සමීකරණය ලියා දක්වන්න.

$(iii)$ $x^2 - 2x - 1 = 0$ වන පරිදි ඇති $x$ හි ධන මූලය සොයන්න.

3. $(a)$ $\frac{x+1}{y} \div \frac{2(x+1)}{x}$ සුළු කරන්න.

$(b)$ ළමයි පිරිසක් ඇපල් ගෙඩි යම් ප්‍රමාණයක් මිල දී ගත්හ. එම සෑම ඇපල් ගෙඩියක්ම සමාන කෑලි 4 කට වන සේ කපා කෑලි 1 බැගින් බෙදාගත් විට කෑලි 3 ක් ඉතිරි වේ. එමෙන්ම සෑම ඇපල් ගෙඩියක්ම සමාන කෑලි 3 කට වන සේ කපා බෙදූ විට කෑලි දෙකක් මදි විය. ළමයි ගණන $x$ ද ඇපල් ගෙඩි ගණන $y$ ද ලෙස ගෙන සමගාමී සමීකරණ යුගලයක් ලියා ළමයි ගණන හා ඇපල් ගෙඩි ගණන සොයන්න.

4. $ABCD$ ලෙස නම් කරන ලද ත්‍රපිසියම් හැඩති ලෝහ තහඩුවක් රූපයෙන් දැක්වේ.




$(i)$ $AD$ දිග මීටර $x$ ලෙස ගෙන $TC$ දිග $x$ ඇසුරෙන් ලියන්න.

$(ii)$ $DC$ දිග $AD$ දිග මෙන් දෙගුණයකට වඩා $2m$ ක් වැඩි නම් $DT$ දිග $x$ ඇසුරෙන් ලියන්න.

$(iii)$ $ABCD$ තහඩුවෙන් $BTC$ සෘජුකෝණී ත්‍රිකෝණාකාර කොටස කපා ඉවත් කළ විට ඉතිරි කොටසේ වර්ගඵලය සඳහා $x$ අඩංගු ප්‍රකාශනයක් ලියන්න.

$(iv)$ ඉතිරි කොටසේ වර්ගඵලය $5m^2$ නම් $x = -1 \pm \sqrt{6}$ බව පෙන්වන්න.

$(v)$ $\sqrt{6} = 2.4$ වන විට සම්පූර්ණ තහඩුවේ වර්ගඵලය $6m^2$ නොඉක්මවන බව පෙන්වන්න.

5. ළඟා විය නොහැකි ස්ථානයක සිරස් දුරකතන කුළුණක් පිහිටා ඇත. පොළොව මත කිසියම් $X$ ලක්ෂ්‍යක සිට බලනවිට කුළුණේ මුදුන $50°$ ක ආරෝහණ කෝණයකින් ද තවත් $40m$ ක් එම තලයේම කුලුණෙන් ඈතට ගොස් බැලූවිට කුළුණේ මුදුන $35°$ ක ආරෝහණ කෝණයකින් ද පෙනේ.

$(i)$ මෙම තොරතුරු මිනුම් සහිතව දළ රූපයක දක්වන්න.

$(ii)$ 1: 1000 (1 cm ⟶ 10m ) පරිමාණයට ඉහත දත්ත සටහන් කරමින් පරිමාණ රූපයක් අඳින්න.

$(iii)$ පරිමාණ රූපය ඇසුරෙන්

$(a)$ කුළුණේ උසත්

$(b)$ $x$ සිට කුළුණ පාමුලට දුරත් සොයන්න.

www.mathsland.org

6. ආයතනයක එක් අංශයක සේවය කරන සේවකයන් 60 දෙනෙකු එක්තරා දිනක ප්‍රමාද වී පැමිණීමේ කාලය පිළිබඳ ව තොරතුරු පහත දැක්වේ.

| ප්‍රමාද වූ කාලය (මිනිත්තු) | 0 – 4 | 4 – 8 | 8 – 12 | 12 – 16 | 16 – 20 | 20– 24 | 24 – 28 | 28–32 |
|---|---|---|---|---|---|---|---|---|
| සේවකයන් ගණන | 5 | 6 | 8 | 10 | 12 | 8 | 7 | 4 |

(0 – 4 යනු 0 හෝ ඊට වැඩි 4 ට අඩු යන්න වේ )

$(i)$ සේවකයෙකු ප්‍රමාද වී ඇතැයි අපේක්ෂිත වැඩිම කාලය කොපමණ ද ?

$(ii)$ සුදුසු උපකල්පිත මධ්‍යන්‍යයක් භාවිතයෙන් හෝ අන් ක්‍රමයකින් හෝ සේවකයකු ප්‍රමාද වීමේ මධ්‍යන්‍යය කාලය මිනිත්තු වලින් සොයන්න.

$(iii)$ මාසයකට දින 20 ක් වැඩ කරයි නම් ද ආයතනයේ එම අංශයේ මුළු සේවක පිරිස 186 ක් නම් ද එම සේවක පිරිස ප්‍රමාද වූ කාලය පැය කීය ද ?

$(iv)$ සේවකයෙකුට පැයකට රු.240 ක් ගෙවයි නම් එම සේවකයින්ට ආයතනයෙන් අහිමි වූ මුදල රු. 240 000 නොඉක්මවන බව පෙන්වන්න.

B කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

7. තොරණක එක් කොටසක කුඩා විදුලි බුබුළු සවිකර ඇත්තේ එකිනෙකට සමාන පරතරයකින් යුක්ත ව සකස් කළ වෘත්තාකාර රාමු මතය. පළමු රාමුවේ විදුලි බුබුළු 16 ක් ද දෙවන රාමුවේ විදුලි බුබුළු 20 ක් ද තුන්වන රාමුවේ විදුලි බුබුලු 24ක ද ආදී වශයෙන් පිළිවෙලට වැඩිවන සේ විදුලි බුබුළු සවි කර ඇත.

$(i)$ මෙම රාමුවල ඇති විදුලි බුබුළු පිළිවෙලින් සමාන්තර ශ්‍රේඩියක පද ලෙස ගත් විට දහවන රාමුවේ සවි කර ඇති විදුලි බුබුළු ගණන කීය ද ?

$(ii)$ අවසාන රාමුවේ විදුලි බුබුළු 76 ක් ඇත් නම් එම කොටසේ ඇති වෘත්තාකාර රාමු ගණන කීය ද ?

$(iii)$ එම තොරණේ මෙවැනි වෘත්තාකාර රාමු කොටස් 3 ක් ඇති නම් ඒ සඳහා අවශ්‍ය වන විදුලි බුබුළු 2 000 ක් බව සෙනෙත් පවසයි. සෙනෙත් ගේ ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාවය පෙන්වා දෙන්න.

8. $(i)$ $AB = 5cm$ ද $AC = 6cm$ ද $C\hat{A}B = 90°$ ද වන $ABC$ ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

$(ii)$ $C\hat{A}B$ හි සමච්ඡේදකය නිර්මාණය කර එය $BC$ හමුවන ලක්ෂ්‍ය $D$ ලෙස නම් කරන්න.

$(iii)$ $D$ සිට $AB$ රේඛාවට ලම්බයක් නිර්මාණය කර $AB$ රේඛාව හමුවන ලක්ෂ්‍ය $E$ ලෙස නම් කරන්න.


$(iv)$ $D$ කේන්ද්‍රය ද $AD$ අරය ද වන වෘත්තයක් නිර්මාණය කරන්න.

www.mathsland.org

$(v)$ දිග මැනීමෙන් තොරව $AE = ED$ බව පෙන්වන්න.

9. $ABC$ සමද්විපාද ත්‍රිකෝණයේ $AB = AC$ වේ. $AB$ හි මධ්‍ය ලක්ෂ්‍ය $D$ වේ. $AC$ පාදය $F$ දක්වා දික් කර ඇත්තේ $DB = CF$ වන පරිදිය. $DE$ රේඛාව $BC$ රේඛාවට සමාන්තරව ඇඳ තිබේ. මෙහි $E$ යනු $AC$ මත පිහිටි ලක්ෂ්‍යයකි. $BC$ හා $DF$ රේඛා $G$ හිදී ඡේදනය වේ.මෙම දත්ත ලකුණු කරන ලද දළ රූපයක් ඇඳ $GC = \frac{1}{4}BC$ බව සාධනය කරන්න.

10. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $P, Q, R, S$ ලක්ෂ්‍ය වෘත්තය මත පිහිටා ඇත. $PQ$ හා $SR$ ජ්‍යායන් සමාන්තර වේ. $QS$ හා $PR$ යන රේඛා $X$ හි දී ද $QS$ හා $PO$ යන රේඛා $Y$ හි දී ද ඡේදනය වේ.




$(i)$ $P\hat{O}S = P\hat{X}S$ බව ද

$(ii)$ $PQX$ ත්‍රිකෝණය හා $XSR$ ත්‍රිකෝණය සමකෝණී බව ද සාධනය කරන්න.

$(iii)$ $P\hat{O}S = 2Q\hat{P}X$ බව පෙන්වන්න.

$(iv)$ ඔබ ඉහතින් ලබාගත් තොරතුරු අනුව එහි සම ද්විපාද ත්‍රිකෝණ දෙකක් නම් කරන්න.

11. අරය $a$ ද උස $6a$ ද වන ඝන ලෝහ සිලින්ඩරයක් උණුකර ලෝහ අපතේ නොයන සේ පතුලේ අරය $r$ ද උස $2a$ ද වන සෘජු ඝන ලෝහ කේතු 20ක් සාදනු ලබයි නම් $r = \frac{3a}{\sqrt{20}}$ බව පෙන්වා $a = 3.25$ විට $r$ හි අගය ලඝුගණක වගු ඇසුරෙන් සොයන්න.

www.mathsland.org

12. $(a)$ $n(A \cap B) = 40$ ද, $n(\mathrm{A}) = 27$ ද, $n(B) = 28$ ද නම් $n(\mathrm{A} \cap \mathrm{B})$ සොයන්න.

$(b)$ විද්ව හා රිද්ම යන දෙදෙනාම පොදු බස් රථ වලින් පැමිණෙන එකම ආයතනයේ සේවය කරන දෙදෙනෙකි. විද්ව තම සේවා ස්ථානයට ප්‍රමාද වී පැමිණීමේ සම්භාවිතාව $\frac{1}{5}$ කි. රිද්ම ප්‍රමාද වී පැමිණීමේ සම්භාවිතාව $\frac{1}{3}$ කි. එකම දිනක මෙම දෙදෙනා සේවා ස්ථානයට ප්‍රමාද වී හෝ ප්‍රමාද නොවී පැමිණීම රුක් සටහනකින් දක්වන්න. ඒ ඇසුරෙන්,

$(i)$ දෙදෙනාම ප්‍රමාද නොවී පැමිණීමේ සම්භාවිතාව සොයන්න.

$(ii)$ එක් අයෙකු ප්‍රමාද වී පැමිණීමේ සම්භාවිතාව සොයන්න.

$(iii)$ දෙදෙනාගෙන් ප්‍රමාද වීමේ වැඩි ප්‍රවණතාවයක් දක්වන්නේ කවරෙක් දැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

2018 - දෙවන වාරය

11 ශ්‍රේණිය

ගණිතය පිළිතුරු පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2400/4= රු.600 | 1+1 | 2 | 14 | $A\hat{X}O = A\hat{Y}O = 90^\circ$ හඳුනා ගැනීම<br>$x = 60^\circ$ | 1<br>1 | 2 |
| 2 | 1188-880/2 = 154cm$^2$ | 1+1 | 2 | 15 | QR = 10 cm ට<br>ST = 5 cm ට | 1<br>1 | 2 |
| 3 | $3X2^7 = 384$ | 1+1 | 2 | 16 | කෝණය 60 °. සිසුන් 30 ට | 1+1 | 2 |
| 4 | $(x-7)(x+3)$ | | 2 | 17 | ප්‍රකාශ දෙකම නිවැරදි | 1+1 | 2 |
| 5 | $A\hat{C}B = 70^\circ$, $x = 40^\circ$ | 1+1 | 2 | 18 | A සිට B පෙනෙනුයේ 40°ක අවරෝහණ කෝණයකිනි. | | 2 |
| 6 | මිනිස් දින 20<br>20 x 2 = 40 | 1<br>1 | 2 | 19 | $\frac{5-0}{6-0}$, $\frac{2}{6}$ හෝ $\frac{1}{3}$ | 1+1 | 2 |
| 7 | $\frac{y}{3} \times \frac{x}{4y} = \frac{x}{12}$ | 1+1 | 2 | 20 | i 6 cm<br>ii 40° | 1<br>1 | 2 |
| 8 | | | | 21 | $\log_2 64 = 6$ | | 2 |
| 9 | නිවැරදි මිනුම් සහිත හැඩ දෙකට | 1+1 | 2 | 22 | බෙදීම දැක්වීමට<br>50 | 1<br>1 | 2 |
| 10 | නිවැරදි අංකන දෙකකට | 1+1 | 2 | 23 | x = 2 හෝ x = -1 | 1+1 | 2 |
| 11 | $6x^2y$ | | 2 | 24 | 2 /6 හෝ 1/3 | | 2 |
| 12 | $P\hat{R}Q = 60^\circ$ හෝ $Q\hat{T}S = 70^\circ$<br>$X = 120^\circ$ | 1<br>1 | 2 | 25 | කෝණ සමච්ඡේදකයට<br>x ලකුණු කිරීමට | 1<br>1 | 2 |
| 13 | $x \geq 2$ හෝ ධන නිඛිලය 2 ට | 1<br>1 | 2 | | | | |

www.mathsland.org

1. (i) $1 - \frac{1}{8} = \frac{7}{8}$ ..................1

(ii) $\frac{7}{8}$ න් $\frac{5}{7} = \frac{5}{8}$................ 2

(iii) $1 - (\frac{1}{8} + \frac{5}{8}) = \frac{2}{8}$..........2

ධාරිතාව = 125 x 8 =1000 ....2

(iv) 1000 /50 = මී.20 ............2

(v) 1 m ....................................1

2. (a) (i) 40000 / 500 = රු.80 ................2

(ii) 40000 - 4000 = 36000............1

(iii) 36000 /500 = රු.72 ................2

(iv) 6 x 500 = 3000 .......................2

(b) $40000 \times \frac{110}{100} \times \frac{110}{100}$ ....................1+1

රු.48400 .........................................1

3. (i) $\frac{22}{7} \times 7 \times 7 \times \frac{1}{4} = 38.5$ cm$^2$ ......2

(ii) $\frac{1}{2} \times BC \times 7 = 38.5$ .....................1

BC = 11 cm ...............1

(iii) $2 \times \frac{22}{7} \times 7 \times \frac{1}{4} = 11$cm...........2

(iv) 11 + 7+11 +13 = 42 .................2

(v) මිනුම - 38.5 /7 = 5.5 ................1

රූපයේ දැක්වීමට ......................1

4 (i) 2 .. .......................................1


(ii) අක්ෂ නම් කිරීමට .................1
අක්ෂ ක්‍රමාංකනයට ...............1
ජාල රේඛයට ..................2

(iii) මධ්‍ය ලක්ෂ්‍ය යා කිරීම ............1
අන්ත ලක්ෂ්‍යන් ට .................2
සංඛ්‍යාත බහු අශ්‍රයට ...............1

(iv) 12 /36 හෝ 1/3 ....................1

5. (a) (i) 100 – 53 = 47 ...........................1

(ii)




100 දැක්වීමට .................1
53 දැක්වීමට .................1
49 දැක්වීමට .................1
31 දැක්වීමට ................1
22 දැක්වීමට .................1
27 දැක්වීමට .................1


(iii) 31....................................1

(b) (i) ලක්ෂ්‍ය ලකුණු කිරීමට ..........1
(ii) 4 /16 හෝ ¼ .........................1

www.mathsland.org

www.mathsland.org

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | | | ගෙවීමට ඉතිරිවන මුදල =18000.....................<br>ණය මුදලේ කොටස =1200.....................<br>මාස ඒකකයකට පොලිය $=1200\text{x}\frac{36}{100}\text{x}\frac{1}{12}$...රු.36<br>මාසඒකකගණන=$\frac{15}{2}(15+1)$..............<br>=120<br>මුළු පොලිය=36x120.....<br>=4320.........<br>වාරිකයක වටිනාකම<br>$=\frac{18000+4320}{15}$.......<br>= රු.1488 ......... | 1<br>1<br>1<br>1<br>1<br>1<br>1<br>1<br>1<br>1 | | 10 |
| 2 | a<br>b | i<br>i<br>ii | y =2.......................<br>නිවැරදි පරිමාණයට........<br>නිවැරදි ලක්ෂ්‍ය 6ක් සඳහා<br>සුමට වක්‍රය.................<br>$x$= 1 ......................<br>y = -( $x-1)^2$ +2.......<br>y = 0 .......................<br>2.2 ±1 .................... | 1<br>1<br>1<br>1<br>1<br>1+1+1<br>1<br>1 | 3<br>3<br>2 | 10 |
| 4 | | i<br>ii<br>iii<br>iv<br>v | $x$.............................<br>$x+2$.......................<br>$x(x+2)$හෝ $x^2+2x$<br>$x^2+2x=5$<br>$x^2+2x-5=0$ ..............<br>$x=\frac{-b\pm\sqrt{b^2-4ac}}{2a}$<br>නිවැරදි ආදේශයට .........<br>$\frac{2\pm2\sqrt{24}}{2}$....................<br>$\frac{-2\pm2\sqrt{6}}{2}$.................<br>x = 1.4<br>ත්‍රපිසියම සූත්‍රයට ආදේශය<br>5.74 $cm^2$ | 1<br>1<br>1<br>1<br>1<br>1<br>1<br>1<br>1<br>1 | 1<br>1<br>1<br>4<br>3 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3 | a<br>b | i | $\frac{x+1}{y}\times\frac{2(x+1)}{x}$<br>$\frac{x}{2y}$<br>4y−$x$ =3 ........<br>3y-$x$ =-2.........<br>4y -3y = 5<br>Y =5<br>y ආදේශයට<br>x =17 | 1<br>1<br>2<br>2<br>1<br>1<br>1<br>1 | 2<br>8 | 10 |
| 5 | | i<br>ii<br>iii | <br>නිවැරදි පරිමාණ රූපයට<br>කුළුණේ උස 73 m .......<br>$x$ සිට කුළුණට දුර = 63m | 2<br>4<br>2<br>2 | | 10 |
| 6 | | i<br>ii<br>iii<br>iv | මිනිත්තු 31<br>නිවැරදි මධ්‍ය අගය තීරයට<br>(වැරදි 1ක් නොසලකන්න.<br>නිවැරදි f x තීරයට<br>f x එකතුවට (960 )<br>960 /60<br>16<br>16 x 20 x 186<br>පැය 992<br>992x240<br>238080<br>238080<240000<br>240000 නොඉක්මවයි | 1<br>1<br>1<br>1<br>1<br>1<br>1<br>1<br>1<br>1 | 1<br>5<br>2<br>2 | 10 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | i | 16+(10-1)4 | 1 | | |
| | | 52 | 1 | | |
| | ii | 76 = 16+(n – 1)4 | 1 | | |
| | | n = 16 | 1 | 2 | |
| | iii | එකතුව සෙවීමේ සූත්‍රයට ආදේශයට | 1 | 2 | |
| | | 8 {32 +60 } | 1 | | |
| | | 736 | 1 | | |
| | | 736 X 3 | 1 | | |
| | | 2208 | 1 | | |
| | | සෙනෙත් ගේ ප්‍රකාශය සත්‍ය වේ.2000 <2208 | 1 | 6 | 10 |
| 8 | i | ත්‍රිකෝණයට | 1+1+1 +1 | 4 | |
| | ii | සමච්ඡේදකයට හා D | 1 | 1 | |
| | iii | ලම්භයට | 1 | 1 | |
| | iv | වෘත්තයට | 1 | 1 | |
| | v | බව පෙන්වීමට | 1+1+1 | 3 | 10 |
| 9 | | නිවැරදි රූපයට | 3 | | |
| | | DEF ට ම.ල .ප්‍රමේය යෙදූ විට 2GC = DE | 1 | | |
| | | ABC ට ම.ල.ප්‍රමේය යෙදූ විට 2DE = BC | 1 | | |
| | | 2 X 2GC = BC | 1 | | |
| | | 4GC = BC | 1 | | |
| | | GC = ¼ BC | 1 | | 10 |
| 10 | I | $P\hat{Q}S$ = $P\hat{R}S$ (එකම ඛණ්ඩයේ කෝණ ) | | | |
| | | $Q\hat{P}X$ = $X\hat{R}S$ (ඒකාන්තර කෝණ ) | 1 | | |
| | | $P\hat{Q}X = Q\hat{P}X$ නිසා | | | |
| | | 2PQX = PXS වේ. | 1 | | |
| | | 2PRS = POS | 1 | | |
| | | POS = PXS වේ. | | | |
| | ii | PQX හා XSR ත්‍රිකෝණ වල | | | |
| | | $P\hat{X}Q$ = $S\hat{X}R$ (ප්‍රතිමුඛ කෝණ | 1 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | $P\hat{Q}X$ = $P\hat{R}S$ (එකම ඛණ්ඩයේ කෝණ) | | | |
| | | $Q\hat{P}X$ = $X\hat{S}R$ (එකම ඛණ්ඩයේ කෝණ ) | 1 | | |
| | | PQX ත්‍රිකෝණය හා XSR ත්‍රිකෝණය සමකෝණී වේ. | 1 | | |
| | | PQX ,XSR | | | |
| | iii | | 2 | | |
| | iv | 2 $P\hat{R}S = P\hat{O}S$ (පරිධිය මත ආපාතිත කෝණය මෙන් දෙගුණයක් වේ කේන්ද්‍රය මත ආපාතිත කෝණය නිසා ) | | | |
| | | $P\hat{R}S$ = $Q\hat{P}X$ (ඒකාන්තර කෝණ ) | 2 | | |
| | | $P\hat{O}S = 2Q\hat{P}X$ | 2 | | 10 |
| 11 | | ~~සූත්‍ර තෝරා ගැනීමට~~ ආදේශයට | 2 | | |
| | | $6a^3 = 1/3 \times 40 \times a \times r^2$ | | | |
| | | $18a^2 = 40r^2$ | | | |
| | | $r = \sqrt{9a^2}/20$ | 1 | | |
| | | ලඝු ගණක 3 ට | | | |
| | | 0.4771,0.5119 | 3 | | |
| | | ,1.3010 | 1 | | |
| | | 1.3010 / 2 = 0.6505 | 1 | | |
| | | lg r = 0.3385 | 1 | | |
| | | r = 2.18 | 1 | | 10 |
| 12 | (a) i | සූත්‍රයට | 1 | | |
| | | ආදේශයට | 1 | | |
| | | 15 | 1 | | |
| | | රුක් සටහනෙහි අතු වලට | 3 | | |
| | (b) ii | $\frac{4}{5} \times \frac{2}{3} = \frac{8}{15}$ | 1 | | |
| | iii | $\frac{2}{15} + \frac{4}{15} = \frac{6}{15}$ | 1 | | |
| | iv | 1 /3 >1/5 නිසා රිද්ම | 2 | | 10 |

www.mathsland.org

